# 9 කර්තෘකාරක වාක්‍ය සහ කර්මකාරක වාක්‍ය

අදහස් ප්‍රකාශනය සඳහා යොදා ගන්නා අරුත් සහිත භාෂාමය ඒකක 'පද' නමින් හැඳින්වේ. පද කීපයක් සම්පූර්ණ අදහසක් ප්‍රකාශ වන පරිදි පිළිගත් රටාවකට අනුව ගැළපීමෙන් 'වාක්‍ය' නිර්මාණය වෙයි. භාෂාවේ හමු වන පද වර්ග සතරකි. 'නාම පද', 'ක්‍රියා පද', 'උපසර්ග' හා 'නිපාත' යනුවෙනි. මේ අතුරෙන් වාක්‍යයක් තැනීමට ඉවහල් වන්නේ නාම පද, ක්‍රියා පද හා නිපාත යි. එක් අවසාන ක්‍රියාවකට සම්බන්ධ වූ පද රටාවක් වාක්‍යයක් වෙයි. සෑම වාක්‍යයක ම 'කර්තෘ' හා 'ක්‍රියාව' යනුවෙන් කොටස් දෙකකි. කර්තෘ 'උක්තය' යනුවෙන් ද ක්‍රියාව 'ආඛ්‍යාතය' යනුවෙන් ද හැඳින්වේ. මේ ප්‍රධාන කොටස් දෙක අතර අඛණ්ඩ අන්‍යෝන්‍ය ගැළපීමක් හෙවත් සම්බන්ධයක් පවතී. මේ සම්බන්ධය හෙවත් 'උක්ත-ආඛ්‍යාත පද සම්බන්ධය' නිවැරදි වාක්‍යයකට අදාළ පළමු වන නීතිය යි. නිවැරදි වාක්‍යයක් නිර්මාණය සඳහා උක්ත-ආඛ්‍යාත පද සම්බන්ධය සිදු කරන ආකාර දෙකක් මේ පාඩමෙන් ඔබට උගත හැකි ය.

උක්ත-ආඛ්‍යාත පද සම්බන්ධය යනු වාක්‍යයක උක්තය හෙවත් ක්‍රියාව සිදු කරන්නා අඟවන නාම පදයත් ආඛ්‍යාතය හෙවත් එම නාම පදයෙන් දැක්වෙන කර්තෘ විසින් සිදු කරනු ලබන ක්‍රියාවත් අතර පැවතිය යුතු ව්‍යාකරණමය ගැළපීම යි. වාක්‍යයක් නිවැරදි ව සංවිධානය වී ඇතැයි පිළිගැනෙන්නේ මේ ගැළපීම මත ය.

උක්ත-ආඛ්‍යාත පද සම්බන්ධය බිඳුණු විට වාක්‍යයෙන් පැවසීමට අපේක්ෂිත අර්ථය නිරවුල් ව හා පැහැදිලි ව ප්‍රකාශ නො වේ. එමතු ද නො ව භාෂාවේ සම්මත නීතිය හෙවත් ව්‍යාකරණය ද බිඳ වැටේ. භාෂාවක් ව්‍යවහාර කළ යුත්තේ ඒ භාෂාවේ සම්මත නීතිවලට හෙවත් ව්‍යාකරණයට අනුකූල ව ය.

වාක්‍යයක උක්තය හා ආඛ්‍යාතය පුරුෂ වශයෙන් ද වචන වශයෙන් ද ආඛ්‍යාතය වෙනුවට කෘදන්ත ක්‍රියාවක් යෙදේ නම් ලිංග වශයෙන් ද එකිනෙක ගැළපිය යුතු ය.

උක්ත-ආඛ්‍යාත පද ගැළපීම අනුව වාක්‍යයක් සකස් වන ක්‍රම දෙකකි.

**වාක්‍යයක උක්ත කර්තෘ හා ආඛ්‍යාතය ( නැත හොත් කෘදන්ත ක්‍රියාව ) එකිනෙක පුරුෂ, වචන හා ලිංග වශයෙන් ගැළපීමෙන් නිර්මාණය කෙරෙන වාක්‍ය, කර්තෘ කාරක වාක්‍ය නමින් හැඳින්වෙයි.**

1. ළමයා පොත කියවයි.
2. ළමයි පොත් කියවති.
3. මිනිසා ගස කපයි.
4. මිනිස්සු ගස කපති.
5. බළලා මීයන් මරයි.
6. බළල්ලු මීයන් මරති.
7. වෛද්‍යවරයා රෝගීන් සුවපත් කරයි.
8. වෛද්‍යවරු රෝගීන් සුවපත් කරති.

මෙහි 1, 3, 5, 7 යන අංක යටතේ දැක්වෙන වාක්‍යයන්හි ළමයා, මිනිසා, බළලා හා

වෛද්‍යවරයා යන නාම පද ඒ වාක්‍යයන්හි කර්තෘ පද යි. එනම් කියවයි, කපයි, මරයි, (සුවපත්) කරයි යන ක්‍රියා පදවලින් පැවසෙන ක්‍රියාව සිදු කරන්නා අඟවන පද යි. ඒ පද ප්‍රථම පුරුෂ ඒක වචන නාම පද බැවින් ඒ හා ගැළපෙන පරිදි උගනී, කපයි, මරයි, (සුවපත්) කරයි යන ක්‍රියා පද ප්‍රථම පුරුෂ ඒක වචනයෙන් යොදා ඇත. මේ සැම වාක්‍යයක ම කර්තෘ පදය ක්‍රියා පදයෙන් උක්ත වීම සිදු වෙයි.

2, 4, 6, 8 යන අංකවලින් දැක්වෙන වාක්‍යයන්හි උක්ත කර්තෘ බහු වචන අර්ථ ගනී. ඒ අනුව අදාළ වාක්‍යයන්හි ක්‍රියා පද බහු වචනයෙන් යොදා ඇති බව පැහැදිලි වනු ඇත.

මේ සැම වාක්‍යයක ම කර්තෘ පදයට අමතර ව තවත් නාම පදයක් බැගින් වෙයි. ඒවා මේ වාක්‍යයන්හි කර්ම පදය වසයෙන් සිටී. කර්ම පදය අනුක්ත ව තැබිය යුතු ය.

ඉහතින් දක්වන ලද සියලු ම වාක්‍ය උක්තයට හෙවත් ක්‍රියාව සිදු කරන්නා අඟවන නාම පදයට අනුකූල ව ක්‍රියා පදය යොදා ඇති වාක්‍ය වේ.

මෙවැනි වාක්‍ය කර්තෘ කාරක වාක්‍ය යනුවෙන් හැඳින්වෙයි.

පුරුෂ භේදය, වචන භේදය හා කාල භේදය කෙරෙහි අවධානය යොමු කරමින් තවත් නිදර්ශන කිහිපයකින් මෙය විමසා බලමු:

| කාලය | පුරුෂය | ඒකවචන | බහුවචන |
|---|---|---|---|
| වර්තමාන | ප්‍රථම | මම ගෙයක් සාදයි. | මිනිස්සු ගෙයක් සාදති. |
| | මධ්‍යම | නුඹ ගෙයක් සාදහි. | නුඹලා ගෙයක් සාදහු. |
| | උත්තම | මිනිසා ගෙයක් සාදයි. | අපි ගෙයක් සාදමු. |
| අතීත | ප්‍රථම | මිනිසා ගෙයක් සෑදුවේ ය. | මිනිස්සු ගෙයක් සෑදූහ. |
| | මධ්‍යම | නුඹ ගෙයක් සෑදුවෙහි. | නුඹලා ගෙයක් සෑදුවෙහු. |
| | උත්තම | මම ගෙයක් සෑදුවෙමි. | අපි ගෙයක් සෑදුවෙමු. |
| අනාගත | ප්‍රථම | මම ගෙයක් සාදයි. | මිනිස්සු ගෙයක් සාදති. |
| | මධ්‍යම | නුඹ ගෙයක් සාදහි. | නුඹලා ගෙයක් සාදහු. |
| | උත්තම | මම ගෙයක් සාදමි. | අපි ගෙයක් සාදමු. |

ඉහත වැකි දෙස බලන විට, කර්තෘ කාරක වාක්‍යවල පහත සඳහන් ලක්ෂණ හඳුනා ගත හැකි ය.

★ කර්තෘ කාරක වාක්‍යය කර්තෘ උක්ත වන නිසා එම උක්ත කර්තෘට අනුව ආඛ්‍යාතය යෙදේ.

උදාහරණ:- **මවුපියෝ** දරුවන් යහමඟ **යවති.**

↓ උක්තය ↓ ආඛ්‍යාතය

★ කර්තෘ කාරක වාක්‍යයක කර්මය අනුක්ත වේ.

උදාහරණ:- ගොවියෝ **ගවයන්** බඳිති

↓ කර්මය

★ උක්ත කර්තෘ අයත් වන පුරුෂයට අනුව ආඛ්‍යාතය ද තැබිය යුතු වේ.

උදාහරණ:- **මම** දේශකයාගේ අදහස් අවධානයට **ගත්තෙමි.**

↓ උත්තම පුරුෂ ඒක වචන ක්‍රියා පදයට අදාළ කර්තෘ

↓ උත්තම පුරුෂ ඒක වචන

**අපි** දේශකයාගේ අදහස් අවධානයට **ගත්තෙමු.**

↓ උත්තම පුරුෂ බහු වචන ක්‍රියා පදයට අදාළ කර්තෘ

↓ උත්තම පුරුෂ බහු වචන

**පද ගැළපීම අනුව වාක්‍යයක් සකස් කර ගත හැකි දෙවන ක්‍රමයක් ද වෙයි. මෙහි දී වාක්‍යයේ අවසාන ක්‍රියාවෙන් කියවෙන්නේ, එනම් උක්ත වන්නේ වාක්‍යයේ කර්ම පදය යි. කර්තෘ පදය අනුක්ත වෙයි.**

1. ළමයා විසින් පොත කියවේ/ කියවෙයි/ කියවනු ලැබේ/ කියවනු ලබයි.
2. ළමයින් විසින් පොත් කියවේ/ කියවෙයි/ කියවනු ලැබේ/ කියවනු ලබයි..
3. මිනිසා විසින් ගස කැපේ/ කපනු ලැබේ/ කපනු ලබයි.
4. මිනිසුන් විසින් ගස කැපේ/ කපනු ලැබේ කපනු ලබයි.
5. බළලා විසින් මීයෝ මැරෙති/මරනු ලැබෙති/ මරනු ලබති.
6. බළලුන් විසින් මීයෝ මැරෙති/මරනු ලැබෙති/ මරනු ලබති.
7. වෛද්‍යවරයා විසින් රෝගීහු සුවපත් කෙරෙති/ සුවපත් කරනු ලැබෙති/ කරනු ලබති.
8. වෛද්‍යවරුන් විසින් රෝගීහු සුවපත් කෙරෙති/ සුවපත් කරනු ලැබෙති/ කරනු ලබති.

මේ වාක්‍යවල දී සිදු වී ඇත්තේ කිමෙක් ද? කර්තෘ කාරක වාක්‍යයකට වඩා මෙහි දී වෙනස්කම් කිහිපයක් දැකිය හැකි ය.

මේ වාක්‍යවල දී කර්තෘ අනුක්ත කොට තිබේ. 'විසින්' යන නිපාතය අනුක්ත කර්තෘ රූපයට ඈඳා ඇත.

කර්තෘ කාරක වාක්‍යයේ අනුක්ත ව තබන ලද කර්මය මෙහි උක්ත කොට ඇත.

ක්‍රියා පදය උක්ත කර්මයට අනුරූප ව යෙදේ. එය කර්ම කාරක ක්‍රියා රූපයක් හෝ කෘදන්ත පදයකට √ ලබ ධාතුව යොදා සකස් කර ගත්තක් හෝ විය හැකි ය.

පුරුෂ භේදය, වචන භේදය හා කාල භේදය කෙරෙහි අවධානය යොමු කරමින් තවත් නිදර්ශන කිහිපයකින් මෙය විමසා බලමු:

| කාලය | පුරුෂය | ඒකවචන | බහුවචන |
|---|---|---|---|
| වර්තමාන | ප්‍රථම | මව විසින් පුතා රකෙයි/ රකිනු ලැබේ. | මව විසින් පුත්තු රකෙති. රකිනු ලැබෙති. |
| | මධ්‍යම | මා විසින් නුඹ රකෙහි/ රකිනු ලැබෙහි. | මා විසින් නුඹලා රකෙහු/ රකිනු ලැබෙහු. |
| | උත්තම | ඔහු විසින් මම රකෙමි/ රකිනු ලැබෙමි. | ඔහු විසින් අපි රකෙමු/ රකිනු ලැබෙමු. |
| අතීත | ප්‍රථම | මව විසින් පුතා රකිණි/ රකිණු ලැබිණි/ රකින ලදි. | මව විසින් පුත්තු රකුණු/ රකින ලදහ/ රකිනු ලැබුණු. |
| | මධ්‍යම | මා විසින් නුඹ රකිණිහි/ රකිනු ලැබුණෙහි/ රකින ලදහි. | මා විසින් නුඹලා රකුණෙහු/රකිනු ලැබුණෙහු/රකින ලදහු. |
| | උත්තම | ඔහු විසින් මම රකුණෙමි/ රකිනු ලැබුණෙමි/ රකින ලදිමි. | ඔහු විසින් අපි රකුණමු/ රකිනු ලැබුණෙමු/ රකින ලදිමු. |
| අනාගත | ප්‍රථම | මව විසින් පුතා රකේ/ රකෙන්නේ/ රකිනු ලැබෙන්නේ | මව විසින් පුත්තු රකෙති/රකෙන්නෝ/ රකෙන්නාහු/ රකිනු ලැබෙති/ රකිනු ලැබෙන්නෝ. |
| | මධ්‍යම | මා විසින් නුඹ රකෙහි/ රකෙන්නෙහි/ රකිනු ලැබෙන්නෙහි. | මා විසින් නුඹලා රකෙහු/ රකෙන්නහු / රකිනු ලැබෙහු/ලැබෙන්නහු. |
| | උත්තම | ඔහු විසින් මම රකෙමි/ රකෙන්නෙමි රකිනු ලැබෙමි / රකිනු ලැබෙන්නෙමි. | ඔහු විසින් අපි රකෙමු/ රකෙන්නෙමු/ රකිනු ලැබෙමු /රකිනු ලැබෙන්නෙමු. |

**කර්ම කාරක වාක්‍යයක විශේෂ ලක්ෂණ කිහිපයකි.**

★ කර්ම කාරක වාක්‍යයක කර්මය උක්ත වන නිසා එම උක්ත කර්මයට අනුව ආඛ්‍යාතය යෙදිය යුතු ය.

උදාහරණ:- ගොවියන් විසින් **ගවයෝ බැඳෙති.**

ගවයෝ → උක්ත කර්මය; බැඳෙති → ආඛ්‍යාතය

★ කර්තෘ අනුක්ත වේ. අනුක්ත කර්තෘ රූපයට පර ව "විසින්" නිපාතය යෙදේ.

උදාහරණ:- **ගුරුවරුන් විසින්** සිසුහු යහමග යැවෙති/ යවනු ලැබෙති/ යවනු ලැබෙත්.

ගුරුවරුන් → අනුක්ත කර්තෘ; විසින් → විසින් නිපාතය

★ උක්ත වන කර්ම පදයට අදාළ ආඛ්‍යාතය පුරුෂය හා වචනය අනුව ගළපා තැබිය යුතු වේ.

★ උක්ත වන කර්මයේ ලිංග භේදය ප්‍රකාශ විය යුතු තැනක දී කෘදන්ත ආඛ්‍යාත භාවිත වේ (මෙය බලපාන්නේ ප්‍රථම පුරුෂ ඒකවචන උක්ත කර්ම පද සඳහා පමණි).

උදාහරණ:- විදුහල්පතිතුමා විසින් ප්‍රධාන ශිෂ්‍ය නායිකාව කාර්යාලයට කැඳවෙයි/ කැඳවනු ලැබෙන්නී ය.

★ ශුද්ධ ආඛ්‍යාතයක් හෝ කෘදන්ත ක්‍රියාවක් හෝ කර්ම කාරක වාක්‍යයක ආඛ්‍යාතය වශයෙන් තැබිය හැකි ය.

★ කර්ම කාරක වාක්‍යවල ශුද්ධ කර්මකාරක ආඛ්‍යාත වෙනුවට "ලබ" ධාතුවෙන් සාදාගත් ක්‍රියා පද ද තැබිය හැකි ය.

★ සකර්මක වාක්‍ය පමණක් කර්ම කාරක වාක්‍ය රටාවෙන් ලිවිය හැකි ය. අකර්මක වාක්‍ය කර්ම කාරක ස්වරූපයෙන් ලිවිය නො හැකි ය.

උදාහරණ:- ගොවියා කුඹුර කොටයි - සකර්මක වාක්‍ය
ළමයා පොත් පාඩම් කරයි

ළමයා නිදයි
ළමයා බිය වේ - අකර්මක වාක්‍ය

කර්තෘ කාරක හා කර්මකාරක වාක්‍ය ලක්ෂණ සංසන්දනාත්මක සාරාංශයක් පහත සටහනෙහි දැක්වේ.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

| කර්තෘ කාරක වාක්‍ය | කර්ම කාරක වාක්‍ය |
|---|---|
| කර්තෘ උක්ත වෙයි.<br>කර්මය අනුක්ත වෙයි.<br>උක්ත කර්තෘට අනුව ආඛ්‍යාතය පිහිටයි. | කර්මය උක්ත වෙයි.<br>කර්තෘ අනුක්ත වෙයි.<br>උක්ත කර්මයට අනුව ආඛ්‍යාතය යෙදේ. |

කර්තෘ කාරක වාක්‍යයක් කර්ම කාරක වාක්‍යයක් බවට පත් කිරීමේ දී අනුගමනය කළ යුතු පියවර හා ඒ සඳහා උදාහරණ පහත දැක්වේ.

'ගොවියෝ ගවයන් බඳිත්' යන කර්තෘ කාරක වාක්‍යය කර්ම කාරකයට හැරවීම.

i. උක්ත කර්තෘ අනුක්ත කරන්න :- ගොවියෝ - ගොවියන්
ii. අනුක්ත කර්තෘට පසු ව 'විසින්' එකතු කරන්න :- ගොවියන් විසින්
iii. අනුක්ත කර්මය උක්ත කරන්නː- ගවයන් - ගවයෝ
iv. උක්ත වූ කර්මයට ගැළපෙන පරිදි හා දී ඇති වාක්‍යයේ කාලයට (අතීත-අනතීත) ගැළපෙන ක්‍රියා පදයක් යොදන්නː- බැඳෙති/බඳිනු ලැබෙති

**මේ අනුව කර්ම කාරක වාක්‍යය**

'ගොවියන් විසින් ගවයෝ බැඳෙති/ බැඳෙනු ලැබෙති' වශයෙන් වේ.

## ලිඛිත අභ්‍යාස

1. **පහත දැක්වෙන කර්තෘ කාරක වාක්‍ය, කර්ම කාරක වාක්‍ය බවට හරවා ලියන්න.**

   i. මම නිරතුරුව ම පොත පත මිල දී ගනිමි.
   ii. විනිසුරුතුමා චූදිතයන් නිදහස් කළේ ය.
   iii. උද්‍යෝගයෙන් කටයුතු කළ ගොවීහු මේ කන්නයේ සරු අස්වැන්නක් ලැබූහ.
   iv. මාධවී මීටර් 100 ධාවන තරගයෙන් ප්‍රථම ස්ථානය දිනා ගත්තී ය.
   v. ඔවුහු නිකරුණේ අප වෙහෙසූහ.

2. **පහත දැක්වෙන කර්ම කාරක වාක්‍ය, කර්තෘ කාරක වාක්‍ය බවට හරවා ලියන්න.**

   i. සතුරන් විසින් අපි පීඩාවට පත් කරනු ලැබුණෙමු.
   ii. කම්කරුවා විසින් තම සේවා කටයුතු ස්වාමියාට පහදා දෙන ලදි.
   iii. අධ්‍යක්ෂතුමා විසින් විද්‍යාලයීය නව ගොඩනැගිල්ල විවෘත කෙරෙයි.
   iv. අප විසින් නුඹ දකිනු ලැබුණෙහි.
   v. ළමයින් විසින් චිත්‍ර අඳිනු ලැබේ.

3. **පහත සඳහන් කෙටි ඡේද කර්තෘ කාරක හා කර්ම කාරක වාක්‍ය යෙදෙන පරිදි ලිඛිත ව්‍යවහාරයෙන් ලියන්න.**

i. වනාන්තර මිනිසුන්ට සම්පතක්. ඉන් අපට ලැබෙන ප්‍රයෝජන අතිමහත්. ඒ බව හඳුනාගත් දූරදර්ශී මිනිස්සු, වන සම්පත ආරක්ෂා කර ගැනීමට කටයුතු කරනවා. අදූරදර්ශී මිනිස්සු වන සම්පත විනාශ කරනවා.

ii. මුදල් ඇමතිතුමා අය-වැය කතාව ඉදිරිපත් කළා. ඉකුත් වර්ෂයේ ආර්ථික සංවර්ධනය සලකා බැලූ ඔහු නව ආර්ථික සංවර්ධන වැඩ පිළිවෙළ අනාවරණය කළා. මන්ත්‍රීවරුන් නව යෝජනා ඉදිරිපත් කළා. විපක්ෂයේ මන්ත්‍රීවරු ද සතුට පළ කළා. ටික දෙනෙක් ඔහුගේ යෝජනා විවේචනය කළා.

iii. සරසවියට නවක සිසුන් පැමිණේ. ජ්‍යෙෂ්ඨ සිසුන් නවකයින් ආදරයෙන් පිළිගනියි. සරසවි ඇදුරන් දේශන කටයුතු ආරම්භ කරයි. නවක සිසුන් සතුටින් ඉගෙන ගනියි.

කර්තෘ කාරක හෝ කර්ම කාරක වාක්‍ය රටා නිවැරදි ව අනුගමනය නො කර ලියවුණු වාක්‍ය වර්තමාන ව්‍යවහාරයෙහි සුලබ ය. කර්තෘ කාරක වාක්‍යයක කර්තෘ උක්ත වන අතර ප්‍රථමා විභක්ති ගනී. ක්‍රියාව/ ආඛ්‍යාතය යෙදිය යුත්තේ උක්ත කර්තෘ අයත් වන පුරුෂ භේදය, සංඛ්‍යා භේදය හා ලිංග භේදය යන ලක්ෂණවලට අනුරූප වන පරිද්දෙනි. කර්තෘ කාරක වාක්‍යයක උක්ත කර්තෘ මෙන් ම කර්ම කාරක වාක්‍යයක උක්ත කර්මය ද අනුක්ත රූප ගන්වා ලියන ලද ව්‍යාකරණ විරෝධී වාක්‍ය බොහෝ විට දැක ගත හැකි වෙයි. ඊට හේතු වන්නේ නාම පදවල උක්ත අනුක්ත රූප භේදය පිළිබඳ නිරවද්‍ය අවබෝධය නො තිබීම යි.

නාම පදවල උක්ත රූපය හා අනුක්ත රූප අතර අර්ථ වසයෙන් වෙනස්කම් ඇති බව ඒවා වාක්‍යයන්හි යෙදෙන ආකාරය අනුව පැහැදිලි කර ගත හැකි ය. මේ අර්ථමය වෙනස්කම් ඇතැම් විට රූපමය වසයෙන් ද දැක ගත හැකි ය. එනම් නාම පදවල උක්ත රූපය හා අනුක්ත රූප වසයෙන් රූප භේදයක් ප්‍රකට වන අවස්ථා වෙයි. "මම" යන උක්ත රූපය සැලකූ කල ඊට අනුරූප අනුක්ත රූපය "මා" යන්න යි. සෙසු අනුක්ත විභක්ති රූප වන මට (මා+-අට) මාගේ (මා + ය), මාගෙන් (මා + ගෙන්) යන රූප සැදී ඇත්තේ මා යන අනුක්ත රූපය මුල් කොට ගෙන බව පැහැදිලි ය. ඒ අනුව උත්තම පුරුෂ ඒක වචන පදයෙහි මම හා මා යනුවෙන් මූලික රූප දෙක ඇති බව පෙන්වා දිය හැකි ය.

එහෙත් ඇතැම් නාම පදවල උක්ත හා අනුක්ත වසයෙන් රූප භේදයක් හැඳින ගත නො හැකි වෙයි. නිදසුන් වසයෙන් බල්ලා යන පදය සලකමු. එහි උක්ත රූපය මෙන් ම අනුක්ත රූපය ද බල්ලා යන්න ම ය.

ආධුනික ලේඛකයන් මෙන් ම ප්‍රකට යැයි සම්මත ලේඛකයන් ද සිය ලේඛනවල දී ක්‍රියා

කාරක පද සම්බන්ධය අවුල් කර ගැනීමට එක් හේතුවක් වන්නේ නාම පදවල උක්ත අනුක්ත රූප භේදය නිවැරදි ව වටහා නො ගැනීම බව පෙනේ. පහත දැක්වෙන්නේ සිංහලයේ නාම පදවල උක්ත අනුක්ත රූප භේදය පැහැදිලි කෙරෙන සටහනකි.

| | උක්ත රූප | | අනුක්ත රූප | |
|---|---|---|---|---|
| | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන |
| උත්තම පුරුෂ | මම | අපි | මා | අප |
| මධ්‍යම පුරුෂ | ඔබ/ නුඹ (තෝ) ඔයා | ඔබ/ නුඹ (තෙපි) | ඔබ/ නුඹ (තා / තී) | ඔබ (නුඹ/ තොප) |
| ප්‍රථම පුරුෂ පුරුෂ ලිංග | හේ/ඔහු උෟ | ඔවුහු (ඔහු) | ඔහු/උෟ | ඔවුන්/ එයාලා |
| ප්‍රථම පුරුෂ ස්ත්‍රී ලිංග | ඕ/ ඈ | ඔවුහු/එයාලා/ ඒ ගොල්ල | ඈ/ ඇය | ඔවුන්/ එයාලා/ ඒ ගොල්ල/උන් |
| ප්‍රථම පුරුෂ නපුංසක ලිංග | එය /ඒක | ඒවා | එය | ඒවා |
| අනියමාර්ථ පුරුෂ ලිංග | (එක්) ළමයෙක්/ මිනිසෙක් | | (එකු/අකු) ළමයෙකු/ මිනිසෙකු/ ළමයෙකු/ මිනිසකු | |
| අනියමාර්ථ ස්ත්‍රී ලිංග | (අක්) ගැහැනියක් | | (අක) ගැහැනියක | |
| අනියමාර්ථ නපුංසක ලිංග | (අක්) ගසක් | | (අක්) ගසක් | |

## 1. ආඛ්‍යාතය සම්පූර්ණ කිරීම සඳහා කර්තෘ පදයට අමතර ව තවත් නාම පදයක් උක්ත කිරීම

වාක්‍යයක අවසාන ක්‍රියාවෙන් නාම පද දෙකක් උක්ත වන අවස්ථා සිංහල වාක්‍ය වින්‍යාසයෙහි ලා හමු වෙයි.

වීම් අර්ථවත් 'ව' ධාතුවෙන් සෑදුණු අවසාන ක්‍රියා පද සහිත වාක්‍යයක් සලකන්න.

'ඔවුහු ක්‍රීඩකයෝ වෙති'
'මාර්ටින් වික්‍රමසිංහ විශිෂ්ට ලේඛකයෙක් වෙයි.'
'අශෝක රජතුමා දැහැමි පාලකයෙක් විය.'

මේ වාක්‍ය තුනෙහි උක්ත කර්තෘ පිළිවෙළින් 'ඔවුහු', 'මාර්ටින් වික්‍රමසිංහ' හා 'අශෝක රජතුමා' යන පද යි.

ඒ සමග ම පිළිවෙළින් 'ක්‍රීඩකයෝ', 'ලේඛකයෙක්' හා 'පාලකයෙක්' යනුවෙන් තවත් නාම පද තුනක් උක්තාර්ථයෙන් එම වාක්‍ය තුනෙහි යෙදී තිබෙනු දැක ගත හැකි ය.

මේ නාම පද ඒ වාක්‍යයන්හි කර්මය නො වේ. කර්මය නම් අනුක්ත විය යුතු ය.

එසේ නම් මේ දෙවන උක්තයට වාක්‍යයෙහි හිමි වන ස්ථානය කුමක් ද?

'ඔවුහු වෙති' යනු අර්ථ විරහිත වාක්‍යයකි. 'ඔහු' එනම් මේ වාක්‍යයේ කර්තෘ 'වන්නේ' කුමක් ද යන්න එයින් ප්‍රකාශ නො වන බැවිනි. මෙය අර්ථ සහිත වාක්‍යයක් වීමට නම් ආඛ්‍යාතය සම්පූර්ණ කළ යුතු ය. අවසාන ක්‍රියාවට පෙර වෙනත් නාම පදයක් යෙදීමෙන් ආඛ්‍යාතය සම්පූර්ණ වේ. මෙසේ ආඛ්‍යාත පූරණය සඳහා යොදන නාම පදය උක්තය හා තුල්‍යාධිකරණ වෙයි. එනම් වචනයෙන්, ලිංගයෙන් හා විභක්තියෙන් උක්තය හා අනුරූප විය යුතු ය. එවිට එවැනි වාක්‍යයක උක්ත දෙකක් ඇති වේ.

මෙවැනි වාක්‍යයක ප්‍රධාන උක්තය වන්නේත් අප්‍රධාන උක්තය වන්නේත් එක ම තැනැත්තෙකි. ඒ දෙදෙන ම වාක්‍යයේ 'කර්තෘ' වෙති. අවසාන ක්‍රියාවෙන් කියවෙන්නේ ඒ දෙදෙනා ම පිළිබඳ ව වන බැවින් මෙවැනි වාක්‍යයක ආඛ්‍යාතයට උක්ත දෙකක් වෙයි. එසේ හෙයින් මෙවැනි වාක්‍ය 'ද්විත්ව උක්ත වාක්‍ය' නමින් ද ආඛ්‍යාතයේ අඩුව පුරවා සම්පූර්ණ කරන හෙයින් 'ආඛ්‍යාත පූරණ' නමින් ද හැඳින්වේ.

ඉහත දක්වන ලද වාක්‍ය තුනෙහි 'ක්‍රීඩකයෝ', 'ලේඛකයෙක්' හා 'පාලකයෙක්' යනුවෙන් තවත් නාම පද තුනක් උක්තාර්ථයෙන් යෙදී ඇත්තේ අවසාන ක්‍රියාවෙන් ප්‍රකාශ වන අර්ථය සම්පූර්ණ කිරීම සඳහා බව මේ අනුව පැහැදිලි වනු ඇත.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

උදාහරණ:- අපි නීතිගරුක පුරවැසියෝ වෙමු.
ඕ/ ඈ නිළියක් වූවා ය/ වෙයි.
නුඹලා අනාගත නායකයෝ වෙහු.
ජෝර්ජ් කීට් විදග්ධ චිත්‍ර ශිල්පියෙක් වෙයි.

මෙවැනි වාක්‍යයන්හි දෙවන උක්තය අනුක්ත රූපයෙන් තැබීම ව්‍යාකරණ විරෝධී වෙයි.

ඔවුහු ක්‍රීඩකයන් වෙති. ×
මාර්ටින් වික්‍රමසිංහ විශිෂ්ට ලේඛකයකු වෙයි. ×
අසෝක රජතුමා දැහැමි පාලකයකු විය. ×
අපි නීතිගරුක පුරවැසියන් වෙමු. ×
ඕ/ ඈ නිළියක වූවා ය/ වෙයි. ×
නුඹලා අනාගත නායකයන් වෙහු. ×
ජෝර්ජ් කීට් විදග්ධ චිත්‍ර ශිල්පියකු වෙයි. ×

★ ඇතැම් විට 'ව' ධාතුවෙන් සෑදුණු ආඛ්‍යාතය වෙනුවට වාක්‍ය අවසානය ඇඟවීම සඳහා 'ය' හෝ 'යි' නිපාත යොදනු ලැබේ. එවිට ද ආඛ්‍යාත පූරණය පෙර සේ ම උක්තය හා සම ව සිටී.

උදාහරණ:- අපි නීතිගරුක පුරවැසියෝ ය/ යි.
ඔහු ලේඛකයෙක් ය/ ලේඛකයෙකි.
නුඹලා අනාගත නායකයෝ ය/ යි.

★ ප්‍රශ්නවාචී 'ද' නිපාතය යෝගයෙහි ද මෙම රීතිය ම අනුගමනය කෙරේ.
උදාහරණ:- ඔහු ලේඛකයෙක් ද?
නුඹලා අනාගත නායකයෝ ද?
අශෝක රජතුමා දැහැමි පාලකයෙක් ද?

★ ඉහත වාක්‍යවලට 'ලු' නිපාතය යෙදීමෙන් ඇසූ බව දැක්වෙන අර්ථයක් (ශ්‍රැති සූචනාර්ථ) එක් වෙයි. එහි දී ද ඉහත රීතිය අනුගමනය කෙරේ.
උදාහරණ:- ඔහු ලේඛකයෙක් ලු.
නුඹලා අනාගත නායකයෝ ලු.
අශෝක රජතුමා දැහැමි පාලකයෙක් ලු.

★ ඇතැම් විට ඉහත වාක්‍ය ආඛ්‍යාතයක් රහිතව ද යෙදේ.
උදාහරණ:- ඔහු ලේඛකයෙක්.
නුඹලා අනාගත නායකයෝ.
අපි ශ්‍රී ලාංකික පුරවැසියෝ.

## 2. උක්තය සම්පූර්ණ කිරීම සඳහා කර්තෘ පදයට අමතර ව තවත් නාම පදයක් උක්ත කිරීම.

උක්තය වසයෙන් යෙදෙන ප්‍රාණවාචී නාම පදයකට පසු ව සංඛ්‍යාර්ථවත් හෝ සමූහාර්ථවත් පදයක් යෙදෙන කල සංඛ්‍යාව හඟවන පදය හා එක් වන පිරිස් වාචී දෙන/ දෙනා යන පද බහු වචනය ගනී.

අපි සියල්ලෝ ම ශ්‍රී ලාංකිකයෝ වෙමු.
සිසුහු තිදෙනෙක් විශිෂ්ට සම්මාන හිමි කර ගත්හ.
කම්කරුවෝ පස් දෙනෙක් සතියකින් පාලම තනා නිම කළහ.
සොරු දෙදෙනෙක් අත්අඩංගුවට පත් වූහ.
ගොන්නු දෙදෙනෙක් ගැල ඇද්දෝ ය.
සැකකරුවෝ සියලු දෙනා නිදහස් කරනු ලැබූහ.

මෙවැනි වාක්‍යයන්හි ආඛ්‍යාතයෙන් කියවෙන කර්තෘ පද දෙක බැගින් වෙයි.
'අපි සියල්ලෝ'
'සිසුහු තිදෙනෙක්'
'කම්කරුවෝ පස් දෙනෙක්'
'සොරු දෙදෙනෙක්'
'ගොන්නු දෙදෙනෙක්'
'සැකකරුවෝ සියලු දෙනා' යනුවෙනි.

මේ කර්තෘ පද දෙක ම වාක්‍යයේ උක්තය සේ ක්‍රියා කරයි. පළමු පදය උක්තය ද දෙවැන්න උක්ත පූරණ පදය ද වසයෙනි. මේ පද දෙක ම උක්ත රූපයෙන් තැබිය යුතු වෙයි. මේ රීතිය උක්ත පූරණ යෝගය යනුවෙන් ද හැඳින්වේ.

## 3. ප්‍රශ්න වාචී යෙදුමකින් අවසන් වන වාක්‍යයක යෙදෙන කර්තෘ වාචක නාම පදය අනුක්ත ස්වරූපය ගනී.

ඇයි? කෙසේ ද? කවදා ද? මොනවා ද? වැනි ප්‍රශ්න වාචී යෙදුම් හා බැඳෙන නාම පද අනුක්ත රූපයෙන් සිටී.

උදාහරණ:- **මිනිසුන්** අවංක නොවන්නේ ඇයි?
දක්ෂ **ක්‍රීඩිකාවක** වන්නේ කෙසේ ද?
අප සාමය ළඟා කර ගන්නේ කවදා ද?
සංගමයේ **සාමාජිකයන්** බලාපොරොත්තු වන්නේ මොනවා ද?

**4. ඇත, නැත, හැකි, යුතු, මැනවි, යෙහෙකි, වටී යන පදයකින් අවසන් වන වාක්‍යයන්හි කර්තෘ වාචක නාම පදය අනුක්ත ස්වරූපය ගනී.**

ඇයි? කෙසේ ද? කවදා ද? මොනවා ද? වැනි ප්‍රශ්න වාචී යෙදුම් හා බැඳෙන නාම පද අනුක්ත රූපයෙන් සිටී.

උදාහරණ:- **ගුරුවරුන්** ඇතැම් පාඩම් අත් හරිනු ඇත.
**සිසුන්** පන්තියට පැමිණ නැත.
**අප** සමගිදම් රැකිය යුතු ය.
පයින් **යන්නන්** පාරේ දකුණු පසින් යා යුතු ය.
සියලු **මිනිසුන්** සත්‍යගරුක විය යුතු ය.
**මා** මහණදම් පිරිය යුතු ය.
**පයින් යන්නන්** පාරේ දකුණු පසින් යෑම මැනවි.
සියලු **මිනිසුන්** සත්‍යගරුක වීම මැනවි.
**අප** මේ ගැටලුව නිරාකරණය කර ගැනීම සඳහා අධිකරණය හමුවට යෑම මැනවි.
**අප** ගිලනුන්ට උවටැන් කරනු වටී.
**ඔවුන්** එය වටහා ගැනීම යෙහෙකි.

**5. ඇත, නැත, හැකි, යුතු යන රූප වරනැඟී වාක්‍යයක යෙදෙන කල ඊට සම්බන්ධ වන කර්තෘ උක්ත ස්වරූපය ගනී.**

උදාහරණ:- **මම** එය කියවා ඇත්තෙමි.
**අපි** සමගිදම් රැකිය යුත්තෙමු.
**පයින් යන්නෝ** පාරේ දකුණු පසින් යා යුත්තා හ.
සියලු **මිනිස්සු** සත්‍යගරුක විය යුත්තෝ ය.
**මම** මහණදම් පිරිය යුත්තෙමි.
**තෙපි** සත්‍යගරුක විය යුත්තහු.

**6. තෙමේ, තොමෝ, තුමූ පද භාවිතය**

තෙමේ, තොමෝ, තුමූ ප්‍රාණවාචී සර්ව නාම උක්ත රූප වේ.
'තෙමේ' යන්න පුරුෂ ලිංග ඒක වචන යි.
'තොමෝ' යන්න ස්ත්‍රී ලිංග ඒකවචන යි.

තෙමේ, තොමෝ යන දෙකෙහි බහු වචනය 'තුමූ' වේ. 'තෙමේ' යන්න 'තෙම' ලෙස ද භාවිත වේ.
මේ පද උක්තය වසයෙන් යෙදෙන කල වාක්‍ය ගැළපීම මෙසේ සිදු වේ.

උදාහරණ :-**ඒ තෙම/ තෙමේ** ගමට **ගියේ ය.**
**ඕ තොමෝ** ගමට **ගියා ය.**
**ඔවුහු තුමූ** ගමට **ගියහ.**

තෙමේ/ තොමෝ යන පද පාලි හා සංස්කෘත භාෂාවලින් ගන්නා ලද අප්‍රාණවාචී අර්ථ ඇතත් පාලි හා සංස්කෘත භාෂාවන්හි ස්ත්‍රී වාචී හෝ පුරුෂ වාචී සේ සැලකෙන නාම හා සංයෝග ව උක්ත වන අවස්ථා ද දැක ගත හැකි වේ. එහි දී ප්‍රාණවාචී අර්ථයක් පළ කළත් ක්‍රියා පදය ඒක වචනයෙන් ම තැබීම සම්මත රීතිය වේ.

උදාහරණ:- **සූර්ය තෙම/ තෙමේ** චණ්ඩ රශ්මිය පතුරුවන්නට විය.
**සභා තොමෝ** සතුටින් විසිර ගියා ය.
**නදී තොමෝ** සෙමෙන් ගලා බසින්නී ය.

මේ පද සභාව, නදිය ඈ විසින් සිංහල රීතිය අනුව අප්‍රාණවාචී සේ වරනඟා යෙදීමේ දී ද ඇතැමුන් මේ පද ස්ත්‍රී ලිංග සේ සලකා 'සභාව තීරණය කළාය', 'නදිය ගලා බස්නී ය' ආදි වශයෙන් ආඛ්‍යාතය ස්ත්‍රී වාචී ලෙස තබනු දක්නට ලැබේ. එහි දී අප්‍රාණවාචී පදයක් උක්තය වශයෙන් යෙදෙන කල අනුගමනය කරන සිංහල රීතිය අනුව වාක්‍ය නිර්මාණය මැනවි.

## ලිඛිත අභ්‍යාස

1. **පහත සඳහන් වාක්‍ය සදොස් නම් ඊට හේතු දක්වා නිදොස් කර ලියන්න.**

   i. දෙස බස රැක ගැනීමට අපි නිබඳ ව තැත් කළ යුතු ය.
   ii. සියලු දේශපාලනඥයෝ ආත්මාර්ථකාමී පුද්ගලයන් නොවේ.
   iii. දරුවෝ දෙමාපියන්ට කීකරු වීම මැනවි.
   iv. ගුරුවරු මීට පක්ෂ ව දැක්වූ අදහස් කවරේ ද?
   v. ඕ තොමෝ ආදරයෙන් මවුපියන් රැකබලා ගත්තේ ය.
   vi. ඔවුන් නිදහස පතා සටන් කළ යුත්තෝ ය.

2. **නිවැරදි වාක්‍යයක් වීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.**

   i. සියලු ජයග්‍රාහකයෝ පැරකුම් විද්‍යාලයේ (ශිෂ්‍යයන්/ ශිෂ්‍යයෝ) වූහ.
   ii. නිවැරදි වියරණ රීති (අපි/ අප) අනුගමනය කළ යුතු ය.
   iii. නොපසුබට උත්සාහයෙන් කටයුතු කළ ඕ තොමෝ මෙවර විභාගයෙන් සමත් (වූවා ය/ විය).
   iv. සියලු (රියැදුරන් /රියැදුරෝ) මාර්ග නීති අනුගමනය කළ යුත්තෝ ය.
   v. පොදු ප්‍රශ්න විසඳීම සඳහා (නගරවාසීහු/ නගරවාසීන්) ඉදිරිපත් වීම මැනවි.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.